
# දිස්ත්‍රික් දත්ත පදනම සඳහා තොරතුරු රැස් කිරීම - 2018

## ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය : වෙන්නප්පුව


**ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ විශාලත්වය (ව.කි.මී) : 38.8Km**

1.2 ශ්‍රී ලංකාව තුළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දළ සිතියම


WENNAPPUWA D.S MAP



1.3 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගම් හා මාර්ග දැක්වෙන සිතියම



1.4 භූගෝලීය පිහිටීම විස්තර හා භූගෝලීය සිතියම



**හැඳින්වීම**

වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ දකුණු සීමාවේ පිහිටා ඇත. වර්ග සැතපුම් 15ක් නොහොත් හෙක්ටයාර 3872.05 ක විශාලත්වයෙන් යුතු තැනිතලා ප්‍රදේශයක් වන වෙන්නප්පුව ග්‍රාමය පිහිටා ඇත්තේ වෙරළබඩ ආසන්නයේය . මෙහි ප්‍රධාන නගරය වෙන්නප්පුව වේ. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට උතුරින් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාවද නැගෙනහිරින් දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාවද දකුණෙන් මා ඔයෙන් හා ගම්පහ දිස්ත්‍රික්ක සීමාවද බටහිරින් ඉන්දියන් සාගරයද වේ. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිළධාරී වසම් 52 කට බෙදා පරිපාලන කටයුතු පහසුකරගෙන ඇත.

## 1.5 ජල සම්පත්

වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සාමාන්‍ය වර්ෂාපතනය මි.මි. 1400 වඩා වැඩියි කොට්ඨාශයේ මැදින් ගිං ඔය ගලා යන අතර අතීතයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ලද පාරු ඇළ හෙවත් හැමිල්ටන් ඇළද ගිං ඔය සමග ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළින් ඇදීයයි. කොට්ඨාශයේ පවතින වැව් සංඛ්‍යාව 10 ක් වන අතර අක්කර 03 ට අඩු වෙන්නප්පුව ගොරකගහ වැව සහ මිරිස්සන්කොටුව කුළම වැව හැරුණුවිට අනෙකුත් වැව් සියල්ල අවුරුද්ද මුළුල්ලේ නොසිදී පවතී.

කොට්ඨාශයේ පහත් බිම් වල භූගත ජලමට්ටම අඩි 08-10 ක් පමණ ගැඹුරින් පිහිටා ඇති අතර පොඩ් -සෝලික් පස සහිත උස් බිම්වල භූගත ජල මට්ටම අඩි 35-40 ක් ගැඹුරින් පිහිටා ඇත. වියලි කාලගුණයක් පවතින මාස වල පෙබරවාරි, මාර්තු, අගෝස්තු කාලවලදී උස් බිම් වල පිහිටි ළිං සමහරක් සිදීයයි.

## 1.6 පසේ ස්වාභාවය

වෙන්නප්පුව කොට්ඨාශයේ පසෙහි විශේෂත්වයක් දක්නට ලැබේ. මහ ඔය සිට උතුර දෙසට විහිදෙන වෙරළෙහි මීටර් 200 සිට 300 පමණ රට අභ්‍යන්තරය දක්වා පැතිරී යන වැලි පස කොට්ඨාශයේ උතුරු මායිම් දක්වා විහිද යයි. මුහුදු බඩ තීරයේ උතුරු දෙසට මා ඔය සිට නයිනමඩම දක්වා විහිදෙන තරමක් මැටි දියළු පසක් දක්නට ලැබේ. මුහුදු වෙරළේ සිට කිලෝමීටර් 3-4 දක්වා නැගෙනහිර දෙසට ව්‍යාප්තව තීරුවක් ලෙස මා ඔය තෙක් ඉතා ගැඹුරු ලෝම පසක් වන රොගොසාල් පස පැතිරී ඇති අතර මෙය ලංකාවේ සීමිතව පැතිර ඇති සම්පතකි.

## 1.7 ඓතිහාසික තොරතුරු

වෙන්නප්පුව නමින් මේ ගම හැඳින්වීම පිළිබඳ මතිමතාන්තර කිහිපයක් වෙයි. එක් මතයක් වනුයේ මෙහි විසූ වන්නියාර් වරයෙක් නිසා වෙන්නප්පුව යන නම ඇති වූ බවයි. වන්නියාර් විසූ පුරය වන්නියාර් පුරය ලෙසත් එය පසුව වෙන්නප්පුර වෙන්නප්පුව ආදි ලෙසත් වෙනස් වූ බවත් ඔවුන්ගේ අදහසයි.

තවත් මතයක් වී ඇත්තේ විශ්ණු දේවාලය යන අර්ථයෙන් වෙන්නප්පුව යන නමින් නම් කෙරුණු බවයි.දැනට කිඹුල්ගාල නමින් හැඳින්වෙන ගිං ඔය වක්‍රව ගලා යන උතුරු නැගෙනහිර කොනේ විශ්ණු දෙවියන් වෙනුවෙන් දෙවොලක් ඉදි කරනු ලැබූ බවත් විශ්ණු දෙවියන්ට කැප වූ ප්‍රදේශය විශ්ණු පුරය හෙවත් වෙණුපුර විය.එසෙත් නැත්නම් විශ්ණු දෙවියන්ට දෙමළින් කී නම අනුව වෙන්නාර් පුරම් ,වෙන්නපූර් යනුවෙන් වෙනස් වී පසු කලෙක වෙන්නප්පුව කියා පද පෙරලුන බවයි. මේ සම්බන්ධව තෙවැනි මතය වන්නේ වරුණ නැමති ප්‍රධානියෙකු මෙහි පදිංචි වීම නිසා ඔහු නමින් වර්ණ පුර නමින්ද පසුව එය වෙන්නප්පුර වී අනතුරුව වෙන්නප්පුව වූ බවයි.

දෙමළ ප්‍රධානියෙකුගේ අනුගාමියෙකු වන වන්නම්පොන්නෙයි නැමැත්තා වෙන්නප්පුවෙහි පදිංචිව සිටි බවත් ඔහු නමින් වෙන්නපුව යැයි ගමට නම යෙදූ බවත් සිවු වෙනි මතයකින් දැක්වේ.මෙසේ මතිමතාන්තර කිහිපයක් පැවත ආවත් අද ද මැද වෙන්නප්පුව පතහා වත්ත නැමති ස්ථානයේ පැරණි මාළිගයක නටඹුන් හා පොකුණක නටඹුන් දක්නට ලැබේ.

## 1.8 දේශගුණය

**උෂ්ණත්වය:-**

අන්තර් මාධ්‍ය කෘෂි කාලගුණික කලාපයට අයත් වෙන්නප්පුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පවතින උෂ්ණත්වය මිනිස් කටයුතු, ශාක හා ජීවින් කෙරෙහිද හිතකර තත්ත්වයක පවති. මෙම කොට්ඨාශයේ කැපි පෙනෙන ඍතු භේදයන් දක්නට නැත. එහෙත් වර්ෂයේ අවම උෂ්ණත්වය දෙසැම්බර් හා ජනවාරි කාලයන් හි පැවතේ.

4

**පසෙහි උෂ්ණත්වය -**

උදය කාලයේදි සෙන්ටි මීටර් 510,20,30,60 සහ 120 ගැඹුරු පසේ ඇති සාමාන්‍ය උෂ්ණත්වය පිළිවෙලින් සෙන්ටිග්‍රේඩ් අංශක 27.4,27.6.,27.9,28.4,29.4,29.3ක් වන අතර සන්ධ්‍යා කාලයේදි එය පිළිවලින් 30.8,30. 2, 29. 3, 28.9,29.9,29.3ක් පමණ වේ.

**වර්ෂාපතනය:-**

මෙම කොට්ඨාශයට වර්ෂාව ප්‍රධාන ඍතු 02 කින් ලැබේ. එනම් අප්‍රියෙල්, මැයි, ජුනි, ජූලි මාස වල නිරිත දිග මෝසම් සුළං වර්ෂාව සහ සැප්තැම්බර් , ඔක්තොම්බර්, නොවැම්බර්, මාස වල ඊසාන මෝසම් සුළං වර්ෂාවය. ඊසාන මෝසම් සුළං වැසි මෙම ප්‍රදේශයට අධික ලෙස බල නොපැවතුනද මෙම කාලයේදි බෙංගාල බොක්කේ ඇති වන අවපාත හා වාසුලි හේතුවෙන් සහ සංවහන වැසි වලින් අධික වැසි ප්‍රමාණයක් එනම් වසරේ මුළු වැසි ප්‍රමාණයෙන් 50% කට අධික ප්‍රමාණයක් ලැබේ.